**TRANSPARENCY INTERNATIONAL SRI LANKA**
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබැන්ක් පාර, කොළඹ 5.
2019.11.01

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>රාජ්‍ය ගොඩනැගිලි ජනාධිපති අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව කැස්බෑව නගර සභාවට අනුබද්ධ, පිළියන්දල සෝමවීර චන්ද්‍රසිරි ශරීර සුවතා මධ්‍යස්ථානය තුළ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂකවරයාගේ රුව සහිත පෝස්ටරයක් එම පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කරන බවට වාර්තා වී ඇත. එයට අදාළ ඡායාරූප මේ සමග අමුණා ඇත.

මෙසේ රාජ්‍ය ගොඩනැගිලි අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය කිරීම සඳහා යොදාගැනීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 6 (i) යන නියමය උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංජීවී අමා මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තූතියි.

මෙයට,

විශ්වාසී,

Lakwijaya Bandara

.................................

ලක්විජය බණ්ඩාර

ජාතික සම්බන්ධීකාරක (PPPR)

Reg No. GA 279 Chairperson: S.C.C. Elankovan Company Secretary: Charuni Gunawardana
Directors: Anushika Amarasinghe, Shreen Saroor, Shyamala Gomez, T. Someswaran, Camena Guneratne, Tony Senewiratne, Pavithra Kailasapathy, Pulasthi Hewamanna

